
Image- calhum.org

ලෝකෙ හොදම සාහිත්‍ය තියෙන්නෙ කොහෙද කියල ඇහැව්වොත් ලාංකිකයන් බොහොමයකගෙ පිලිතුර වෙන්නෙ රුසියානු සාහිත්‍යය කියන එක. උදාහරණ විදියට 1917 රුසියානු විප්ලවයෙන් පස්සෙ බිහිවුනු පොත් කීපයක නම් වුනත් කියයි. බහුතරය මතය ඒක වුනත් ලංකාව තුල අතිශය ජනප්‍රිය වුනු මේ සාහිත්‍යය දේශපාලන මතවාද මිනිස්සු අතරට යවන්න පාවිච්චි කරපු උපක්‍රමයක් ද කියල හිතන්නත් බැරිකමක් නෑ.

" ගුරු ගීතය" කියන නම ඇහුනොත් දුයිශෙන්,අල්තීනායි,පොප්ලර් ගස් මතක් වෙන්න තරම් ලංකාවෙ ගොඩක් ජනප්‍රිය වෙච්ච රුසියන් නව කතාවක් ගුරු ගීතය. බොහෝ දෙනෙක් කියපුව නිසා කතාව ආපහු මතක් කරන්න අවශ්‍ය නෑ කියල හිතනව.
මේ කතාවට,චරිත වලට ආස නොවුනු, සිතුවිලි වලින් හරි කතාව ඇතුලෙ ජීවත් නොවුනු කෙනෙක් හොයාගන්න එක ලේසි වැඩක් නෙවෙයි.
කොච්චර ජනප්‍රිය වුනත් මේ වගේ පොත් වලින් ලංකාවෙ සමාජය යහපත් තැනක් වෙන්න දැනෙන විදියෙ බලපෑමක් වුනාද?එහෙම නැත්නම් විවිධ  වාමාංශික කණ්ඩායම් වල මතවාදය ප්‍රචලිත වෙන එක විතරද මේ පොත් වලින් වුනේ කියන එක ප්‍රශ්නයක්

මේ පොත ඇතුලු රුසියන් සාහිත්‍යය උත්කර්ශයට නගන පිරිස් කියන්නෙ යහපත් මිනිස්සු නිර්මාණය වෙන්න, කොන්දේසි විරහිතව මිනිස්සු වෙනුවෙන් පෙනී ඉන්න මිනිස්සු නිර්මාණය වෙන්න ,පරාර්ථකාමී මිනිස්සු නිර්මාණය වෙන්න මේ පොත් හේතු වෙනව කියන එක.

ඇත්තටම එහෙම වෙනව නම් නිදහස් අධ්‍යාපනයේ ගුණ වර්ණනා කරන ගමන් මහා පරිමාණ ටියුෂන් කරන, දුශ්කර පත්වීමක් ලැබුනු ගමන් නගරයට මාරුවීම් හදාගන්න උත්සහ කරන ගුරුවරු බිහිවෙයිද? දුයිශෙන්ලව වර්ණනා කරන ගමන් වැඩ වර්ජන කරන ගුරුවරු බිහිවෙයිද?(අනෙක් වෘත්තීන් වලටත් මේ කරුනා අදාලයි)

ලංකාවෙ නැතිවුනත් මේ වගේ කෘතිවල නිජබිම වෙච්ච රුසියාවෙවත් දුයිශෙන්ලව වගේ මිනිස්සු ඇත්තටම බිහිවුනාද කියන එකත් ප්‍රශ්නයක්

රුසියානු සාහිත්‍යය කියවපු, කියවන ,රස විදින හැමෝම දේශපාලන වශයෙන් වෙනස් අදහස් දරන අය වෙන්න පුලුවන්.සාහිත්‍යය රස විදින්න ඒක බාධාවක් නෙවෙයි. ඒත් පොත් වලින් මවල පෙන්නන සුන්දර මිනිස්සු බවට ඒ පොත්වල අඩංගු දේශපාලන මතවාදය පිලිගන්න මිනිස්සු වත් පත් නොවෙන එක ගැටලුවක්.

ජනප්‍රිය රුසියානු සාහිත්‍ය ඇත්තටම දේශපාලන මතවාදයක් ව්‍යාප්ත කිරීමේ අරමුණින් ලියවුනත් ඒ කෘති රස විදින්න ඒක බාධාවක් කරගන්න අවශ්‍ය නෑ. ලෝකෙ හොදම සාහිත්‍ය තියෙන්නෙ රුසියාවෙ වගේ නිගමන වලට එන්න හදිස්සි වෙන්න අවශ්‍යත් නෑ. අනෙක් රටවල සාහිත්‍යය ගැන නොදැන ඒ ගැන විනිශ්චයක් දෙන්න හදිස්සි වෙන්න ඕනෙ නෑ. යහපත් මිනිස්සු නිර්මාණය වෙන්න වෙන්න පොත්වලින් වෙන බලපෑම අවතක්සේරු කරන්න බෑ. ඒ නිසා දිගටම පොත් කියවමු. කියවපු දේ හිතන්න, ප්‍රශ්න කරන්න පුරුදු වෙමු.